**නියාගම ප්‍රාදේශීය සභාව - 2023**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නියාගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් මැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයන්හි ගොඩනැගිලි සංවර්ධනය කිරීම වෙනුවෙන් හා උපකරණ වෙනුවෙන් දරා තිබුණු වටිනාකම් පිළිවෙලින් රු.39,939,033 ක් හා රු.650,800 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂයන්හි අය කරගෙන තිබූ රු.10,249,549 ක එක්වන් මුදල් ආදායමට ගැලපීම් නොකර ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | තැන්පතුවලින් ඉවත් කර ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කර්මාන්ත ණයගැති සහ ණයහිමි රු.53,718 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ දී ලැබී තිබුණු රු.126,630 ක පුස්තකාල පොත් ප්‍රාග්ධනිත නොකිරීම, නිවැරදි කිරීමේ දී ණයහිමි ගිණුම හර කිරීම නිසා ණයහිමි සහ පුස්තකාල පොත් ගිණුම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි | - එම - | - එම - |
| (ඉ) | ඉකුත් වර්ෂයේ දී සේවක ණය ගිණුමට හා අත්තිකාරම් ගිණුමට වැඩිපුර හර කර තිබූ පිළිවෙලින් රු.109,158 ක් හා රු.30,700 ක් නිවැරදි කිරීම සඳහා සමුච්චිත අරමුදල් ගිණුමට හර කිරීම හේතුවෙන් එම ගිණුම ඉහත වටිනාකමින් අඩු වී තිබුණි. | - එම - | - එම - |
| (ඊ) | එකිනෙකට සමාන විය යුතු ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් හා ආධාර මඟින් දායක වීමේ ශේෂය අතර රු.145,654 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | මෙම ගිණුම් දෙක එකිනෙකට සමාන විය යුතුය. |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී | ඉදිරියේ දී නිවැරදි කරන බව. | අසමානතාවයන් සසඳා ගිණුම් |

| | |
|---|---|
| ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.59,135,679 ක වෙනසක් පැවතිණි. | නිවැරදි කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය | 2018 වර්ෂයෙන් පසු රු.19,947,965 ක වියදමින් ඉදි කරන ලද හා සංවර්ධනය කරන ලද කිලෝමීටර් 4764 ක් වූ මාර්ග 36 ක් මාර්ග ඉන්වෙන්ට්‍රියට ඇතුළත් කර ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 | 2023 වර්ෂය තුළ වාහන 04 කට අදාළව සිදු වී තිබුණු හානි හා පාඩු සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7.2 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ දී ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීමට සභාවේ වාහනය භාවිතා කිරීම වෙනුවෙන් එහි ඉන්ධන සඳහා රු 295,547.ක් ගෙවීම් කර තිබුණි. | හදිසි ආපදා කටයුතු වලදී කඩිනමින් ප්‍රතිචාර දැක්වීම සඳහා සභාවේ වාහනය සභාව තුළ තිබිය යුතු බව. | පිරිවැය අවම වන පරිදි කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.7,560,476 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.422,422 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | 2023 බිල් කළ ආදායම | 2023 රැස් කළ ආදායම | 2023 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,781,827 | 1,244,968 | 1,490,497 | 658,789 | 2,526,723 | 1,414,293 | 1,502,138 | 904,318 |
| කුලී | 7,417,640 | 5,242,993 | 5,088,465 | 754,839 | 6,219,950 | 4,642,500 | 4,643,741 | 600,311 |
| බලපත්‍ර ගාස්තු | 410,600 | 315,743 | 332,560 | - | 496,400 | 238,767 | 246,017 | 16,817 |
| වෙනත් ආදායම් | 6,403,000 | 6,342,408 | 6,342,408 | - | 3,404,000 | 7,174,259 | 7,174,259 | - |
| | 17,013,067 | 13,146,112 | 13,253,930 | 1,413,628 | 12,647,073 | 13,469,819 | 13,566,155 | 1,521,446 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.1,521,446 ක් වූ අතර, අවසානයට එය රු.1,413,628 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකිරීමේ ප්‍රගතිය වර්ධනය කරගත යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) උප වගන්තිය ප්‍රකාරව තල්ගස්වල ඇතුළු දියුණු ගම් ප්‍රදේශවලින් වරිපනම් බදු අය කිරීමට ප්‍රාදේශීය සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදාළ කටයුතු කඩිනමින් සිදු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වරිපනම් බදු තක්සේරුව 2014 වර්ෂයේ සිදුකර තිබුණු අතර, නව තක්සේරුවක් සිදු නොකිරීමෙන් සභාවට උපයාගත හැකි ආදායම් අහිමි වීමක් සිදු වී තිබුණි. | 2024 වර්ෂයේ සිට කඩ තක්සේරුව යටතේ වරිපනම් බදු අය කරන බව. | නව තක්සේරු වටිනාකම මත වරිපනම් බදු අය කළ යුතුය. |
| (ඈ) | සභාව සතු එක් කඩ කාමරයක් 2015 වර්ෂයේ සිට බදු නොදී නිශ්කාර්යව තිබූ බැවින් රු.388,850 ක මුදලක් අහිමි වී තිබුණි. | කඩ කාමරය බදු දීමට ගිවිසුම් ගත වී ඇති බව. | කඩ කාමරය බදු දී ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභා බල ප්‍රදේශය තුළ සවිකර ප්‍රදර්ශනය කර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු 29 ක් වෙනුවෙන් රු.333,600 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු උසාවි දඩ රු.357,250 ක් හා මුද්දර ගාස්තු රු.2,194,757 ක් විය. | ප්‍රධාන ලේකම් කාර්යාලය හඳුන්වා දී ඇති උපදෙස් පරිදි කටයුතු කරන බව. | හිඟ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව විසින් පරිහරණය කරනු ලබන අක්කර 17 රූඩ් 03 පර්චස් 18.93 ක් වන ඉඩම් 25 ක අයිතිය විධිමත්ව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉඩම් පවරා දීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් බුක්තිවිඳින හා පරිහරණය කරන ඉඩම් 03 ක පර්චස් 271 ක භූමි ප්‍රමාණයක් මෙන්ම වටිනාකම රු.52,400,000 ක් හා වර්ග මීටර් 413 ක් වූ ගොඩනැගිලි 03 ක් ඵලදායී ආර්ථික කටයුත්තකට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ඵලදායී කටයුතු සඳහා ඉදිරියේ දී කටයුතු කරන බව. | සභාව සතු දේපල ඵලදායී කටයුතු සඳහා භාවිතා කළ යුතුය. |
| (ඇ) | භාවිතයට ගනු ලබන පිරිවැය හඳුනාගත නොහැකි වාහන හා යන්ත්‍රෝපකරණ 05 ක් සභාව නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව නමින් ලියාපදිංචි කිරීමට හා පිරිවැය හඳුනා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | සභාව නමින් ලියාපදිංචි කර පිරිවැය හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2** **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළව නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.553,855 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අවශ්‍ය බිල් ගෙවීමේ දී ප්‍රධාන ඉංජිනේරුගේ උපදෙස් ලබාගෙන කටයුතු කරන බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |